# ලංසු කැඳවීමයි

## සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

## ලංසු අංකය - 067/T/2021

## මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිටත වැට වටා එල්ලෙන විදුලි අලි වැටක් ඉදිකිරීම කිරීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් **මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිටත වැට වටා එල්ලෙන විදුලි අලි වැටක් ඉදිකිරීම** සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් හත්දහස් පන්සියයක (රු 7,500.00)** මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශය වෙතින් **05.10.2021 වන දින සිට 09.11.2021 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දාම කළමනාකරණ අංශ කාර්යාලයේදී හෝ අපගේ www.airport.lk අන්තර්ජාල වෙබ් අඩවියෙන් නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ මුද්‍රා තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම **2021 නොවැම්බර් මස 10 වන බදාදා දින ප.ව. 2.00** ට අවසන් වන අතර අදාල ලංසු විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දාම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැක.

ලංසු සුරකුම් වෙනුවෙන් මුදලින් **රුපියල් ලක්ෂ තුනක් (රු. 300,000.00)** ලංකාවේ ක්‍රියාත්මක මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් නිකුත් කරන බැංකු ඇපකරයක් මඟින් සභාපති, සී/ස. ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ගෙවෙන සේ ලංසු ඉදිරිපත් කළ යුතුය

ලංසු තැබීමට අදාල විස්තර පැහැදිලි කිරීම **2021 ඔක්තෝම්බර් මස 27 වන දින පෙ.ව. 10.30** ට මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, ඉංජිනේරු කාර්යාලයේදී පවත්වනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දාම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264102 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

**සභාපති,**
**සී/ස. ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල,**
**කටුනායක.**